ශ්‍රවණ උපකරණ ලබාදීමේ ක්‍රමවේදය

**<u>ප්‍රතිලාභින් තෝරා ගැනීම</u>**

- ප්‍රාදේශීය ලේකම් කාර්යාල පුරා විසිර සිටින ශ්‍රවණ ආබාධිත තත්වයෙන් පෙලෙන වැඩිහිටියන් සඳහා මෙම වැඩසටහන ක්‍රියාත්මක කෙරේ.
- වයස අවුරුදු 60 ඉක්මවූ මාසික ආදායම රු. 6000.00 ට අඩු ආදායම්ලාභි වැඩිහිටියන් විය යුතුය.

**<u>ඉල්ලුම්පත් ඉදිරිපත් කිරීම</u>**

- වැඩිහිටියාගේ තොරතුරු නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් මඟින් ලබා ගත යුතුය.
- සෑම අයදුම්කරුවකු විසින්ම සහතික කරන ලද වෛද්‍ය වාර්තාව ඉල්ලුම් පත්‍රයට අමුණා තිබිය යුතුය.
- අදාල අයදුම්පත ග්‍රාම නිලධාරි හා වැඩිහිටි විෂය සම්බන්ධ නිලධාරියා විසින් සහතික කර ප්‍රාදේශීය ලේකම් විසින් අනුමත කර තිබිය යුතුය.

**<u>ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය</u>**

- ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් නිවැරදිව සම්පූර්ණ කර එවන ලද අයදුම්පත් ලැබෙන පිළිවෙල අනුව ලේඛනගත කෙරේ.
- එකවර අයදුම්පත් එකකට වඩා එවීමේදී ප්‍රමුඛතා ලේඛනයක් එවීමට කටයුතු කල යුතුය.
- ශ්‍රවණ උපකරණ මිළදී ගන්නා ආයතනයට ඇණවුම භාරදීමෙන් පසුව අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට කුරියර් කරනු ලැබේ.
- ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට යවන ලද ශ්‍රවණ උපකරණ අදාල ප්‍රතිලාභියාට භාරදීමෙන් පසුව ප්‍රතිලාභින් ලබාගත් බවට සනාථ කෙරෙන අත්සන් ලේඛනය ජාතික වැඩිහිටි ලේකම් කාර්යාලයට එවිය යුතුය.

  .